# කාර්යසාධන වාර්තාව

# 2023

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

அரச தொழில்முயற்சிகள் திணைக்களம்
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Department of Public Enterprises**
**Ministry of Finance, Economic Stabilization and National Policies**

මහා භාණ්ඩාගාරය
කොළඹ 01

பொது திறைசேரி
கொழும்பு 01

**General Treasury**
**Colombo 01**

# කාර්යසාධන වාර්තාව - 2023

*වැය ශීර්ෂය - **241***

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# අන්තර්ගතය

**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය** **1-4**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 4

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 4

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 5-6

**පරිච්ඡේදය 03 – 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය** **7-12**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 7

3.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය 8

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 9

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 11

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 11

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන 11

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 12

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **13 - 24**

**පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක** **25-31**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 25 -31

**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** **32 -35**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 32-33

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 34 -35

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ** **36 - 41**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 36

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය 36

6.3 මානව සම්පත් සංවර්ධනය 37 – 41

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** **42 - 52**

# 1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි [1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මුල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, වරාය, පොදු ප්‍රවාහන, ගුවන් සේවා, ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යාපාර 430 ක් අතරින් ව්‍යාපාර 52 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යාපාර [2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යාපාරවලින් 305 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යාපාර 125 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

## 1.2. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

**අරමුණු**

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම

---

1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

2.සේවා සහ භාණ්ඩ විකිණීම මඟින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාළව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

## 1.4. සංවිධාන සටහන




අ.අ.ජ. - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ. - සහකාර අධ්‍යක්ෂ

සං.නි. - සංවර්ධන නිලධාරි
ක.සේ.නි. - කළමණාකරණ සේවා නිලධාරි
කාර්යාල සේවක සේවය - 08
රියදුරු සේවය - 08

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- කෘෂිකාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කාර්මාන්ත අංශය
- පාලන හා ගිණුම් අංශය

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නොවේ.

## 2. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2023 වසරෙහි ලබාගත් ප්‍රගතිය, එයින් රටට හා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ 2024 වසරේදී ලඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන 2023 කාර්ය සාධන වාර්තාව සඳහා පෙරවදනක් සැපයීමට ලැබීම මා ලද ගෞරවයක් සේ සළකමි. 2021 හා 2022 වර්ෂයන් මෙන්ම 2023 වර්ෂයද රාජ්‍ය ව්‍යවසායන් කෙරෙහිත්,පොදුවේ ජාතික ආර්ථිකය කෙරෙහීත් අභියෝග රැසක් පැවැති වර්ෂයකි. 2023 වර්ෂයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සළකා බලන විට පහත කරුණු වැදගත් වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ සමඟ අනුගත වෙමින් ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි මූල්‍ය ප්‍රකාශන එළිදැක්වීම සඳහාම වෙන්කළ අන්තර්ජාල පිටුවක් නිර්මාණය කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හැකිවිය.එම රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලබන තීරණයන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව පිළිබිඹු කරනුයේ යාවත්කාලීන කරන ලද මූල්‍ය ප්‍රකාශන මඟින් වන බැවින් ද , එම තොරතුරු ලබාගැනීම මහජනතාව සතු අයිතිවාසිකමක් වන බැවින්ද ,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් ගෙන ඇති මෙම පියවර බොහෝ ඇගයීමට ලක් වී ඇත.

කෙසේ වෙතත්, ඇතිවිය හැකි මූල්‍ය අවදානම සැළකිල්ලට ගනිමින්, රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය ඉහළ නැංවීමට වඩාත් ප්‍රායෝගික ප්‍රවේශයක් අනුගමනය කිරීමට සිදුවූ අතර, ව්‍යාපාර ක්‍රියාවලිය නැවත සකස් කිරීම, කාර්යසාධන ගිවිසුම්වලට එළඹීම, දැඩි අධීක්ෂණය හා උපායමාර්ගික සැලසුම්වලට අනුකූලව මෙහෙයුම් කටයුතු සිදු කිරීම එයට ඇතුළත් වේ. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායන් මඟින් ජාතික ආර්ථිකය කෙරෙහි ඇති කරනු ලබන මූල්‍ය පීඩනය අවම කිරීමටත්, මධ්‍යකාලීනව මහජන මුදලින් සිදුකරන ලද ආයෝජන මත ලැබෙන ප්‍රතිලාභ වර්ධනය කර ගැනීමටත් අපේක්ෂිතය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් ගිවිසුමේ ඇතුළත් කොන්දේසි සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබාදෙන ලදී. බලශක්ති අංශය සඳහා පිරිවැය මත ගළපන ලද මිලකරණයක් හඳුන්වාදීම, තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන්හි ශේෂපත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම, නිසිකලට ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන එළිදැක්වීම යනාදිය ඒ අයුරින් ප්‍රමුඛ කාර්යයන් වේ.

2023 වර්ෂයේදී ද පැවති ගැටළුකාරී ආර්ථික තත්ත්වය තුල වුවද, ජලය, විදුලිය, ඖෂධ, ගුවන්සේවා, ඉන්ධන සහ විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සහන කාල ලබා දෙමින් බැංකු සේවාවන් වැනි අත්‍යවශ්‍ය සේවාවන් සපයමින් ජනතාවගේ ජීවන තත්ත්වය හා ජීවන මාර්ගයන් සුරක්ෂිත කිරීමට කැපීපෙනෙන භූමිකාවක් ඉටු කිරීමට රජය සතු ව්‍යාපාර මෙහෙයවීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමත් විය.

2023 වර්ෂයේදී රජය සතු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් රුපියල් මිලියන 60,497 ක අයබදු ආදායමක් රැස්කර ගැනිමට හැකියාව ලැබී ඇත. එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව සියයට 145 ක ප්‍රමාණයක් වේ. එසේම 2023 වර්ෂයේ රජය සතු සමාගම්වලින් රු.මිලියන 15,204 ක ලාභාංශ ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 174 ක් වේ.

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ලාභාංශ ආදායම සියයට 150 කින්ද අයබදු ආදායම සියයට 175 කින්ද වර්ධනය වී ඇත.

රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියට (PED MIS) 2022 වසර අවසානය වන විට රාජ්‍ය ව්‍යාපාර 101ක තොරතුරු ඇතුළත් කර තිබූ අතර, 2023 වසර තුල තවත් රාජ්‍ය ව්‍යාපාර 30කට අදාළ තොරතුරු පද්ධතියට ඇතුළත් කරන ලදී.

එමෙන්ම, එම රාජ්‍ය ව්‍යාපාර 30 නියෝජනය කරන සභාපතිවරුන් ඇතුළු ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් 2023 වසර තුළ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශයේ මූලිකත්වයෙන් පවත්වන ලදී.

රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන මහා භාණ්ඩාගාර නියෝජිතයන් සඳහා ඔවුන්ගේ වගකීම පැහැදිලි කරමින් වැඩමුළුවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගරු සභාපතිතුමාගේ හා විගණකාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 වසරේ මැයි මාසයේදී පවත්වන ලදී. තවද, එම වැඩමුළුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම උදෙසා මහා භාණ්ඩාගාර නියෝජිතයන් සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන් හා විගණන ප්‍රමිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද බාහිර සම්පත්දායකයන්ගේ සහභාගීත්වයෙන් 2023 වසරේ ජූලි මාසයේදී පවත්වන ලදී.

රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය සඳහා රාජ්‍ය භාග විශ්ලේෂණය කළ අතර රාජ්‍ය භාග අයකිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

ප්‍රථම වතාවට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් 2022 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවක් පිළියෙල කළ අතර එම වාර්තාව ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය මගින් පවත්වනු ලබන හොඳම වාර්ෂික වාර්තාව තේරීමේ තරඟයට ඉදිරිපත් කරන ලදී.

තවද, 2023 වර්ෂය තුල මෙම දෙපාර්තමේන්තුවේ කළමණාකරණ තොරතුරු පද්ධතිය පරිශීලකයින්ට පහසු වන අයුරින් සංවර්ධනය කරන ලදී .

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පාලන විනිශ්චය තක්සේරු කිරීමේ (Governance Diagnostic Assessment) වාර්තාවේ නිර්දේශ අනුව ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ නම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙහි පළකරන ලදී.

වාර්ෂික වාර්තා පිළියෙල කිරීමේ මෙන්ම විගණනය කළ වාර්ෂික ගිණුම් ලබා ගැනීමේ පවතින ප්‍රමාදයන් සහ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය අධීක්ෂණය ශක්තිමත් කරන ලදී. මෙහිදී ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එසේ ප්‍රමාදයන් පවතින සහ ගිණුම්වල අඩුපාඩු පවතින රාජ්‍ය ව්‍යාපාර කැඳවා අවශ්‍ය උපදෙස්, තාක්ෂණික සහාය සහ මගපෙන්වීම ලබා දෙන ලද අතර, එම රාජ්‍ය ව්‍යාපාරයන්හි ප්‍රගතිය අඛණ්ඩව සමීපව අධීක්ෂණය කෙරේ.

2021 වර්ෂයේදී නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන ප්‍රකාරව සියලුම රාජ්‍ය ව්‍යවසායයන් විසින් තම ආයතන සඳහා පරිපාලන හා මූල්‍ය අත්පොත් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බව PED 01/2021 (iii) චක්‍රලේඛය මඟින් දැනුම් දී ඇත. මීට අමතරව, සියලුම මව් සමාගම් විසින් සිය පාලිත සමාගම් සඳහා 2023 වසර අවසානයට පෙර පාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව PED 01/2021 (ii) චක්‍රලේඛය මඟින් දැනුම් දී ඇත. මෙම කටයුතුවල ප්‍රගතිය 2024 වර්ෂය තුළ අධීක්ෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉහත කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්තුමා, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් විසින් ලබාදුන් සහයෝගය මහත් සේ අගය කරන අතර, මහා භාණ්ඩාගාරයේ නිලධරයන්ටත් විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීතාව පළකර සිටිමි.



පී. ඒ. එස්. අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**පී. ඒ. සුසන්ත අතුල කුමාර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**
**මහා භාණ්ඩාගාරය**
**කොළඹ 01.**

## 3 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 | තත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | 75,701,120,763 | 28,092,481,812 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 75,701,120,763 | 28,092,481,812 | ඒසීඒ-1 |
| 50,402,457,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **75,701,120,763** | **28,092,481,812** | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 263,312,929,972 | 111,784,487,387 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 345,475 | 36,625 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 6,885,550 | 4,789,127 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 334,559,087,285 | 185,391,245,045 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **597,879,248,281** | **297,180,558,184** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **673,580,369,044** | **325,273,039,995** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 33,378,088 | **800,596,332** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **673,546,990,956** | **324,472,443,663** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 75,210,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 65,348,699 | 71,681,704 | ඒසීඒ-2(ii) |
| 547,412,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 511,649,673 | 26,876,836 | ඒසීඒ-2(ii) |
| 1,928,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,726,882 | 775,304 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 624,550,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **578,725,254** | **99,333,844** | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | - | ඒසීඒ-2(ii) |
| 3,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,558,734 | 763,636 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| 313,927,060,600 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනිම | 13 | 263,847,084,631 | 136,895,097,785 | ඒසීඒ-2(ii) |
| 1,500,000 | හැකියා වර්ධනය | 14 | 840,005 | 476,093 | ඒසීඒ-2(ii) |
| 5,156,049,275 | වෙනත් මූලධන වියදම් | 15 | 5,156,049,275 | - | ඒසීඒ-2(ii) |
| 319,087,609,875 | **මුළු මූලධන වියදම් (උ)** | | **269,005,532,645** | **136,896,337,513** | |
| | තැන්පතු ගෙවීම් | | 348,975 | 39,050 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,713,760 | 3,825,027 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 333,536,806,685 | 159,825,526,288 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **333,542,869,419** | **159,829,390,364** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 603,127,127,318 | 296,825,061,721 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **70,419,863,639** | **27,647,381,943** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 70,419,863,639 | **27,647,381,943** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | - | ඒසීඒ-3 |
| | | | **70,419,863,639** | **27,647,381,943** | |

1



## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

### 2023 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තථ්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 38,222,748 | 36,664,014 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 9,796,086 | 10,967,876 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **48,018,834** | **47,631,890** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම | | 9,796,086 | 10,964,376 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 38,222,748 | 36,664,014 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | 3,500 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **48,018,834** | **47,631,890** |

පිටු අංක 01 සිට 26 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ...................... | ...................... | ...................... |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 27/2/24 | දිනය : 2024.02.21 | දිනය : 2024.02.21 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

පී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

වයි.එල්. විජේසූරිය
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය ව... දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | තකය | |
|---|---|---|
| | **2023** රු. | **2022** රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | | - |
| ආදායම් නොවන ලැබීම් | 5,276,049,275 | 445,177,934 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 4,066,330 | - |
| අග්‍රිම ලැබීම් | 263,312,929,972 | 111,784,487,387 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 7,343,852 | 4,853,028 |
| තැන්පතු ලැබීම් | 345,475 | 36,625 |
| වෙනත් ප්‍රධාන ලෙජර | 334,559,087,285 | 25,565,718,758 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **603,159,822,189** | **137,800,273,732** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 576,689,172 | 98,465,850 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,726,882 | 775,304 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 216,900 | 234,650 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 33,378,088 | 800,596,332 |
| අත්තිකාරම් ගෙවීම් | 5,122,843 | 3,825,027 |
| තැන්පතු ගෙවීම් | 348,975 | 39,050 |
| වෙනත් ප්‍රධාන ලෙජර ගෙවීම් | 333,536,806,685 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **334,154,289,544** | **903,936,213** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **269,005,532,645** | **136,896,337,519** |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| මූලධන වියදම් | 269,005,532,645 | 136,896,337,519 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **269,005,532,645** | **136,896,337,519** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(269,005,532,645)** | **(136,896,337,519)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(0)** | - |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

### 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- ඒ වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

6

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව (රු.) | සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | ප්‍රමාණය (රු.) | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.03.00 | ලාභ | 73,000,000,000 | 41,669,457,000 | 60,496,772,520 | 145 % |
| 2002.04.00 | ලාභාංශ | 6,000,000,000 | 8,733,000,000 | 15,204,348,243 | 174 % |

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු.) | සංශෝධිත ප්‍රතිපාදනය (රු.) | | |
| පුනරාවර්තන | 624,550,000 | 624,550,000 | 578,725,254 | 93% |
| ප්‍රාග්ධන | 75,554,500,000 | 319,087,609,875 | 269,005,532,645 | 84% |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන (රු.) | සංශෝධිත ප්‍රතිපාදන (රු.) | | |
| -- | -- | -- | -- | -- | -- | -- |

**3.8** **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය**

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,047,564.35 | 1,047,564.35 | -- | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 22,375,183.49 | 22,375,183.49 | -- | 100% |
| 9153 | ඉඩම් | අදාළ නොවේ | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටිපීඩී/ඒ/පීඊඩී/එෆ්ඒ/2023/05 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 31 දින

3 1 MAY 2024

ගණන්දීමේ නිලධාරි

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

214

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

213

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) **ආදායම් සංකේතාංකය 20:02:03:00 - ලාභ**

(i) 2023 වර්ෂය සඳහා ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.41,669,457,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.60,496,772,520 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 145 ක් වී තිබුණි.

(ii) ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 ට අදාළව රාජ්‍ය ව්‍යවසායන් 10ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 88 ත් අතර පරාසයක පැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු. මිලියන 6,396 ක ලාභ ආදායමක් ලැබී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යවසායන් 12 කින් ඇස්තමේන්තු කරන ලද ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 25 ක සිට 300 ක දක්වා පරාසය ලාභ ප්‍රමාණයකින් ආදායමට දායක වී තිබුණි.

(v) ආදායම් සංකේත 20.02.03.00 - (ලාභ) යටතට දායක විය යුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වන ආයතන එනම්, සංස්ථා 38 ක් සහ ව්‍යවස්ථාපිත ආයතන 46 ක් පැවතිය ද, 2023 වර්ෂයේ ලාභ යටතට දායකය වන ආදායම් ඇස්තමේන්තුව සැකසීමේදී ආයතන 34 ක් එනම්, මුළු ප්‍රමාණයෙන් සියයට 40 ක් පමණක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සියයට 60 ක් ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබා ගත නොහැකි ආයතන ලෙස ඇස්තමේන්තු සකස් කර තිබුණි.

212

(ආ) **ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම**

(i) 2023 වර්ෂයේ ආදායම් සංකේතාංක 20.02.04.00 - ලාභාංශ ආදායම සඳහා ඇස්තමේන්තුගත ආදායම රු. 8,733,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.15,204,348,243 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.6,471,348,243 ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තු ගත ආදායමට වඩා සියයට 74 ක වැඩි වීමකි.

(ii) රාජ්‍ය ව්‍යවසායන් 03 කින් රු.මිලියන 134 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද එම ආයතනවලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.

(iii) රාජ්‍ය ව්‍යවසායන් 04 ක ලාභාංශ ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව, තත්‍ය ආදායමේ අඩුවීම සියයට 47 ත් 92 ත් අතර පරාසයක පැවතුණි.

(iv) රාජ්‍ය ව්‍යවසායන් 13 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 33ක සිට සියයට 2,500 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.

(v) 2023 වර්ෂයේ ඇස්තමේන්තු ගත ලාභාංශ ආදායමට ඇතුලත් නොකරන ලද රාජ්‍ය ව්‍යවසායන් 4 ක්, සමාලෝචිත වර්ෂය තුලදී ලාභාංශ ආදායමට රු.මිලියන 7,131.2 කින් දායක වී තිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන රාජ්‍ය සමාගම් 50ක් තිබුණද, ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායන් යටතට ඇතුලත් කර තිබුණේ රාජ්‍ය සමාගම් 16 ක් පමණක් බව නිරීක්ෂණය විය.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයන් 14 කට අදාළව විචලතාවය සියයට 40 ක අඩුවීමේ සිට සියයට 326 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් ව තිබුණි.

211

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 6 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය කළ පසු රු.50,125,840,726 ක ඉතිරියක් පැවති අතර ,එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 48 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 2(ඇ) (iii) ඡේදය ප්‍රකාරව වැය විෂය 1003 - වෙනත් දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 06 කින් අඩුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එම වැය විෂය යටතේ වූ ඉතිරිය රු.1,106,269 ක් පමණක් වූ අතර ,එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන කර නොගත් ඇති වැය විෂයයන් 13 ක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් එකතුව රු.114,533,109,879 ක් වූ ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණ බව නිරීක්ෂණය විය.

**2.3 බැදීම් හා බැරකම්වලට එළඹීම**

මු.රෙ.94(1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සේවයක් හෝ සැපයුමක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා වූ මුදල් ප්‍රතිපාදන ඉක්මවා කිසිම වියදමකට හෝ බැදීමකට නොබැඳිය යුතු වුවද, වැය විෂයය 241-1-1-1402 යටතේ 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිපාදන ඉතිරිවීම් රු.64,590 ක් වී තිබු නමුත්, එම ඉතිරිය ඉක්මවා රු.27,857 ක බැරකමකට බැඳී තිබුණි.

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2020අගෝස්තු 28දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2022/02හි 10ඡේදය හා 2018අංක 19 දරන ජාතික විගණන පනතේ (2)16වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු වුවද ,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2023වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024පෙබරවාරි 28දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

210

3. මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 මැයි 22 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1550/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 7 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශ පත්‍රයක් සම්බන්ධයෙන්ම එවැනි ටිකට්පත් විකිණීමේ ආකාරය සහ හෝ නිකුත් කිරීම නොසලකා ඇ.ඩො. 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කරනු ලැබිය යුතු බවත්, එම ගැසට් පත්‍රයේ 8 ඡේදය ප්‍රකාරව එලෙස එකතු කරගනු ලබන අධිභාර මුදල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ හැකි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බවත් දක්වා ඇත. ඒ අනුව 2008 අගෝස්තු 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අධිභාරය ලෙස රු.මිලියන 22,113 ක් එකතු කර ගෙන තිබුණ ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් 2017 ජූනි 12 දින නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය වන "මෙම අධිභාරය තවදුරටත් අය කර ගැනීමට හැකියාව ඇති බවත්, එම අධිභාර මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ නීතිමය බැඳීමක් පවතින බවත්" සඳහන් කර 2017 අප්‍රේල් 07 දිනැති නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය ද සමඟ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වන විටත් මෙම අධිභාර මුදල සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අයකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන ආයකත්වය

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදී.

(i). 2023 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රාග්ධන ආයකත්වය ලෙස රු.1,124,665,353,761 ක් සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 13 ක 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.1,047,966,900,772 ක් වූ අතර, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය ඍණ රු.630,632,144,273 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ මෙම ප්‍රාග්ධන ආයකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට

209

පත්ව ඇති බව නිරීක්ෂණය විය. තවද, මේ සඳහා මූලික වශයෙන් බලපා ඇත්තේ අදාළ ආයතන අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය ඍන අගයක් ගැනීම බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii). 2023 දෙසැම්බර් 31 දිනට රු.1,019,627,985,708 වන සහ 2022 දෙසැම්බර් 31 දිනට රු.892,034,785,542 ක් වූ රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.371,771,137,033 ක් පමණක් විය. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය .

(iii). 2022 දෙසැම්බර් 31 දිනට පැවති රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.2,165,981,657,905 ක් වූ අතර, එයින් රු.2,121,653,720,125 ක් රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ආයෝජනය කර තිබුණි. සමස්තයක් ලෙස ගත් කළ රජය සතු මෙම ව්‍යාපාර ආයතනවල ශුද්ධ වත්කම්වල මුළු වටිනාකම 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,669,676,388,290 ක් වී තිබුණි. ඒ අනුව, ඉහත වර්ග තුනට අදාළ රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව සියයට 21 කින් හෙවත් රු.451,977,331,835 කින් අපහායනය වී ඇති බව නිරීක්ෂණය විය.

(iv). 2022 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩල 32 කට අදාළව රු.117,718,706,426 ක ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, රාජ්‍ය සංස්ථා 36 කට සහ රජය සතු සමාගම් 30 කට අදාළව පිළිවෙලින් රු.804,795,113,607 ක් හා රු.133,722,486,417 ක් ලෙස ශුද්ධ අලාභ ඉපයීම හේතුවෙන් මෙම ආයතන 98 ට අදාළව සමස්තයක් වශයෙන් රු.820,798,893,548 ශුද්ධ අලාභයක් උපයා ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 22,181,000 වූ අතර, ඒ අනුව රජය සතු ව්‍යාපාර ආයතන 98 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය රු.37,000 ක් පමණ වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iv). 2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යසායන් 17 කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ජංගම අනුපාතය 0.15 ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ

208

අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(v). 2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනයට වඩා ගෙවීමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය සෘන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මගින් මූල්‍යනය කර තිබුණි .ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(vi). රාජ්‍ය ව්‍යවසායන් 8 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 10,803 ක් වූ අතර, රජයේ මූලය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 4,323 ක් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 6,479 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(vii). රාජ්‍ය ව්‍යවසායන් 9 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 994,992 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 995,171 ක් වීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 178 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(viii). 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථ කිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 09 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 135 ක් අඩුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි.

(ix). Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,573 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබුණ ද, රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වී ඇත්තේ කොටසක මිල රු.100 ක් වූ කොටස් 200,000 ක

ප්‍රාග්ධන දායකත්වයක් පවතින බවයි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයේ ප්‍රාග්ධන දායකත්වය රජයේ මූල්‍ය ප්‍රකාශනයේ රු.504,725,732 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

(x). රාජ්‍ය ව්‍යවසායන් 04 කට අදාළව, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 113,071 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 123,878 ක් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 10,806 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(xi). රාජ්‍ය සමාගම් 02 ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට කොටස් වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද , එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 14,476ක් ලෙස දක්වා තිබුණි .ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල කොටස් වටිනාකම රු.මිලියන 9,336ක් වැඩියෙන් ප්‍රාග්ධන දායකත්වය දක්වා තිබුණි.

(xii). රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 241,651 ක් වූ අතර, ඉන් රු.මිලියන 34,090 ක් එනම් සියයට 14 ක එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය.

(xiii). රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ව්‍යවසායන් 05 ක් සඳහා රු.මිලියන 176 ක ප්‍රාග්ධන දායකත්වයක් සිදුකර තිබුණ ද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාවෙහි වෙනසක් සිදු වී නොතිබුණි.

(xiv). මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ඇවර කිරීම සම්බන්ධව අංක MOF/DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා අංක (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් සමාගම ඇවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කර වාණිජ මහාධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2018 මාර්තු 18 දින ඇවරකරුවකු අධිකරණය විසින් පත් කර තිබුණු තත්ත්වයකදී මහජන බැංකුවෙන් එම ආයතනය ලබා ගත් ණය වාරික හා

206

පොළිය ගෙවීම සඳහා 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 272 ක් හා රු.මිලියන 441 ක් වශයෙන් එකතුව රු.මිලියන 713 ක් වූ මිහින් ලංකා (පෞද්ගලික) සමාගම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී තිබුණි.

(xv). සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන් 15 යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආයෝජනය කරන ලද කොටස් ගණන සටහන් කර නොතිබුණු අතර වටිනාකම රු.1,271,480,516 ක් ලෙස සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් හිමිකාරීත්වය සියයට 50.23 ක් වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි එය සියයට 49.5 ක් ලෙස දක්වා තිබුණි.

(xvi). රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 269,386 ක් වූ අතර, ඉන් රු.මිලියන 228,771 හෙවත් සියයට 85 ක් 2023 සැප්තැම්බර් 26 දිනැති අමප 23/1812/604/118-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කරන ලද ස්කන්ධ ආයෝජනයන් හේතුවෙන් වැඩි වී තිබුණි.

(ඇ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. මෙ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i). රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, 2024 මැයි 25 දින වන විට පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය අනුව දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52 අතුරින් ආයතන 33 ක පමණක් 2022 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

(ii). 2023 වර්ෂය වෙනුවෙන් 2024 මැයි 25 දින වන විට එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් කිසිඳු ආයතනයක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

